අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/04/60/19/Pro to NS/2026 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2026.07. 02 |

සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් වෙත
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් වෙත
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් වෙත
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් වෙත
සියලුම පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් වෙත

**<u>පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් ජාතික පාසල් වෙත ස්ථාන මාරු කිරීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026</u>**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ජාතික පාසල්හි පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් ස්ථාන මාරු කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් කැඳවීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තීරණය කර ඇත.

02. ඒ අනුව 2026.07.02 දින සිට මාර්ගගත ක්‍රමවේදය හරහා https://nspt.moe.gov.lk යන වෙබ් අඩවිය ඔස්සේ අයදුම්පත් භාරගැනීම සඳහා සියලු කටයුතු සූදානම් කර ඇති අතර ජාතික පාසල් සේවය සඳහා කැමැත්ත පළ කරන වර්තමාන පළාතෙහි සේවා කාලය 2026.06.30 දිනට පූර්වාසන්න වසර 03 ට වැඩි නිලධාරීන් හට මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට හැකියාව පවතී. අයදුම්පත් භාර ගැනීම 2026.07.31 දින ප.ව. 12.00 ට අවසන් වේ.

03. එසේම යම් සුවිශේෂී අවස්ථාවකදී හැර අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන සියලු ස්ථාන මාරු මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය අවසන් වන තුරු සිදු නොකරන බව කාරුණිකව දැනුම් දෙන අතර පළාත් රාජ්‍ය සේවයේ නියුතුව සිට මේ වන විට ජාතික පාසල් වෙත ස්ථාන මාරුවීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇතත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් විධිමත් ස්ථාන මාරු නියෝග ලිපි නොලද නිලධාරීන්ද මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සිදු කිරීම අනිවාර්ය බව වැඩිදුරටත් දන්වා සිටිමි.

04. මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව 2027 වර්ෂයේදී මෙවැනිම ක්‍රමවේදයක් ඔස්සේ නැවතත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට ජාතික පාසල් වෙත ස්ථාන මාරු ලබාගැනීමට අවස්ථාව ලබා දෙන තුරු පළාත් රාජ්‍ය සේවයෙන් ජාතික පාසල් වෙත ස්ථාන මාරුවීම් ලබා දෙනු නොලැබේ.

05. එබැවින් ඔබ ජාතික පාසලක් වෙත ස්ථාන මාරු ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් මෙම අවස්ථාවේ අයදුම් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

06. ජාතික පාසල් සඳහා අනුමත කාර්යමණ්ඩලය තුළ 2026.06.30 දිනට පවත්නා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පුරප්පාඩු ප්‍රමාණය www.moe.gov.lk යන වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධ කර ඇති අතර පුරප්පාඩු පවතින පාසල් සඳහා පමණක් අයදුම් කිරීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

07. පුරප්පාඩු සඳහා අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ ජ්‍යෙෂ්ඨතාවය අනුව වන අතර එකම දිනයක පත්වීම් ලබා ඇති සේවයේ ස්ථිර කර ඇති නිලධාරීන්ගේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

08. ජාතික පාසලක් සඳහා ස්ථාන මාරු ලැබූ නිලධාරියෙකු එම ජාතික පාසලෙහි අවම වශයෙන් වසර 03 ක් සේවය කළ යුතුය. තවද, පළාත් රාජ්‍ය සේවයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව හෝ පසුව ලබා දීමේ පදනම මත මුදා හැරීමට නිර්දේශ කරන නිලධාරීන් සඳහා ජාතික පාසල් වාර්ෂික ස්ථාන මාරු වලදී හෝ නව බඳවාගැනීමේ දී අනුප්‍රාප්තිකයින් ලබා දීමට බලාපොරොත්තු වන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

09. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටු ලේකම්ගේ අංක ESC/APP/SLPS/10/16/2026 හා 2026.06.17 දිනැති ලිපිය ප්‍රකාරව මෙම ස්ථාන මාරු සිදු කිරීමේදී ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ස්ථාන මාරු කිරීමට සලකා බලනු ලබන්නේ I ශ්‍රේණිය සඳහා අනුමත තනතුරු සඳහා පමණක් වන අතර II හෝ III ශ්‍රේණියට අනුමත තනතුරු සඳහා ඔවුන් ස්ථාන මාරු කිරීමට සලකා බලනු නොලබයි.

10. එසේම අධිසේවක පදනම මත 2012.08.08 දිනැතිව ශ්‍රී ලංකා විදුහල්පති සේවය වෙත පත්වීම් ලද නිලධාරීන්හට රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/2-5/1/2020 හා 2022.06.02 දිනැති ලිපිය අනුව මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා අයදුම්කිරීමට හැකියාවක් නොමැත.

11. පළාත් රාජ්‍ය සේවයේ සිට ජාතික පාසල් සඳහා ස්ථාන මාරු අපේක්ෂිත එහෙත් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩු නොමැති වීම හේතුවෙන් මෙවර ස්ථාන මාරු ලැබීමට සුදුසුකම් නොලබන නිලධාරීන් හට ඉදිරියේදී ජාතික පාසල්හි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථිර විදුහල්පති තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමේදී ඒ සඳහා අවස්ථාව හිමිවන බවද කාරුණිකව දන්වමි.

කේ.කේ.පී. ආරියසිංහ
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
ලේකම් වෙනුවට